# පුරප්පාඩු
# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
# කොන්ත්‍රාත් පදනම මත [පරිපාලක (විදුලි) / කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) / පෙදරේරු] තනතුරු සඳහා බඳවා ගැනීම

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පරිපාලක (විදුලි) / කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) / පෙදරේරු තනතුරු සඳහා විශ්වවිද්‍යාලයට පිළිගත හැකි සේවා පළපුරුද්දක් ඇති පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් www.sjp.ac.lk/vacancies සබැඳිය මගින් බාගත කළහැකි අතර, **අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතිකවල සහතික කරන ලද පිටපත් ද සමඟ 2024.01.31 දින හෝ එදිනට ප්‍රථම "සහකාර ලේඛකාධිකාරී, අනධ්‍යයන ආයතන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ"** යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු අතර අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරෙහි අයදුම්කරන තනතුර සඳහන් කල යුතුය.

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලිවීම, තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබීම හෝ අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවේ. කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කල විට කුමන හේතුවක් නිසා හෝ යලි සලකා බැලීම සිදු නොකෙරේ. කොන්ත්‍රාත් පදනම මත මෙම පත්වීම ලැබීම හේතුවෙන් විශ්වවිද්‍යාලයේ ස්ථිර තනතුරක් ලැබීමට ද හිමිකම් නොලැබේ.

<u>**කොන්ත්‍රාත් පදනම මත පරිපාලක (විදුලි)**</u>

**සුදුසුකම් :-**

I. ජාතික තාක්ෂණ සහතිකය (විදුලි) හෝ සමාන සුදුසුකම් සමඟ අවුරුදු තුනක (03) සේවා පළපුරුද්ද (සේවා පළපුරුද්ද ජාතික තාක්ෂණ සහතිකය පාඨමාලාව හැදෑරීමේ කාලය තුලදී ලබා තිබීම ප්‍රමාණවත් වේ.)

හෝ

II. දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් විෂයන් හයක් සමත්වී තිබීම හා රජයේ දෙපාර්තමේන්තුවක, පළාත් පාලන ආයතනයක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක අදාල ක්ෂේත්‍රයේ පරිපාලකවරයෙකු වශයෙන් අවුරුදු පහක (05) පළපුරුද්දක් ලබා තිබීම.

**වැටුප :- රු. 31,625.00 (මූලික වැටුප) + රු. 7,800.00 (ජීවන වියදම් දීමනාව) + රු. 5,000.00 (කොමිෂන් සභා චක්‍රලේඛ 02/2022 යටතේ විශේෂ දීමනාව)**

**බඳවා ගැනීම :-** වෘත්තීය පරීක්ෂණයක් / සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**වයස :-** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය

**<u>කොන්ත්‍රාත් පදනම මත කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු)</u>**

**සුදුසුකම් :-**

I. අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී,

- සිංහල භාෂාව / දෙමළ භාෂාව
- ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍යය
- ගණිතය

යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 ක් එක්වරක දී සමත් වී තිබීම.

සහ

II. අ.පො.ස. (උ.පෙළ) විභාගය එක් වරකදී සියලු විෂයයන් සමත් වී තිබීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

- පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 06 කට නොඅඩු පිළිගත හැකි පරිගණක යෙදුම් පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

- පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර 02 ක පළපුරුද්ද

**තනතුරට විශේෂ වූ සුදුසුකම් :-**

- ගබඩා පාලනය පිළිබඳව වසරක පළපුරුද්ද සහ/හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී වාණිජ්‍ය විෂයය සමත්ව තිබීම හෝ අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ගණකාධිකරණය විෂයය සමත්ව තිබීම.

**සටහන :-** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතන විසින් තීරණය කරනු ලබන පරිදි ආරක්ෂක තැම්පතුවක් / ඇප මුදලක් ඉදිරිපත් කළයුතුය.

වැටුප **:- රු. 30,725.00 (මූලික වැටුප) + රු. 7,800.00 (ජීවන වියදම් දීමනාව) + රු. 5,000.00 (කොමිෂන් සභා චක්‍රලේඛ 02/2022 යටතේ විශේෂ දීමනාව)**

**බඳවා ගැනීම :-** ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**වයස :-** වයස අවුරුදු 18 ත් 30 ත් අතර විය යුතුය.

**<u>කොන්ත්‍රාත් පදනම මත පෙදෙරේරු</u>**

**සුදුසුකම්:-**

I. කියවීමට හා ලිවීමට හැකියාව තිබිය යුතුය.

II. පහත සඳහන් ක්ෂේත්‍රයන් පිළිබඳව දැනුමක් තිබිය යුතුය.

(අ) බිත්තිපාද, බිත්ති ආරුක්කු කේතුමය කණු, දුම් කවුළු කසළ කාණු කුහර ආදිය ඉදිකිරීමේදී උපයෝගී කර ගන්නා ගඩොල් වැඩ සහ නොයෙකුත් ආකාරයේ ක්‍රම.
(ආ) සියලුම අත්දමේ බදාමයන්, ශක්තිමත් කරන ලද කොන්ක්‍රීට් මිශ්‍ර කිරීම හා දැමීම.
(ඇ) සැලසුම් කියවීම හා සරල ඉදිකිරීම් සඳහා අත්තිවාරම දැමීම.
(ඇ) එමල්ෂන් තීන්ත පාවිච්චි කිරීම ඇතුළු තීන්ත ආලේප කිරීම.

III. පෙදෙරේරු වැඩ පිළිබඳව වසර 02 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

**වැටුප :- රු. 29,915.00 (මූලික වැටුප) + රු. 7,800.00 (ජීවන වියදම් දීමනාව) + රු. 5,000.00 (කොමිෂන් සභා චක්‍රලේඛ 02/2022 යටතේ විශේෂ දීමනාව)**

**බඳවා ගැනීම :-** වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**වයස :-** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**අයදුම්කරුවන් තම ඉපයීම්වලින් 10% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු අතර, විශ්වවිද්‍යාලය මගින් එකී ඉපයීම් වලින් 15% කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදලට බැර කරනු ලැබේ. එයට අමතරව 3% ක මුදලක් විශ්වවිද්‍යාලය මගින් සේවක භාරකාර අරමුදලට බැර කරනු ලැබේ.**

**කොන්ත්‍රාත් කාලසීමාව :-** මූලිකව මාස 05කට වන අතර සේවා තත්ත්වය මත කොන්ත්‍රාත් සේවා කාලය දීර්ඝ කිරීමට හැකියාව ඇත.

**ලේඛකාධිකාරී**